# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1838 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 12/12/2024<br>පැය 1810 |

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**මාර්ග අවහිරතාවයක් - පැල්මඩුල්ල පොලිස් වසම .**

ශ්‍රීපාද වන්දනා වාරය 2024.12.14 වන උඳුවප් පුර පසලොස්වක පොහොය දින ආරම්භ කර 2025 වර්ෂයේ වෙසක් පුර පසලොස්වක පොහොය දිනෙන් අවසන් වීමට නියමිතව ඇත.

ඒ අනුව පැල්මඩුල්ල ගල්පොත්තාවල විහාරස්ථානයේ තැන්පත් කර ඇති සමන් දේව ප්‍රතිමාව, සධාතුක කරඬුව සහ දේව ආභරණ මහජනතාවට වැඳපුදා ගැනීමට අවස්ථාව සලසා දීම 2024.12.12 වන අද දින සිදු කිරීමෙන් පසු 2024.12.13 වන දින ගලප්පොත්තාවල රජමහා විහාරස්ථානයේ සිට **රත්නපුර පලාබද්දල මාර්ගයේ හා කුරුවිට එරත්න මාර්ගයේ** ශ්‍රීපාද මළුව දක්වා වැඩම කිරීමට නියමිතව ඇත.

මෙම පෙරහර ගමන් කිරීමට නියමිත **A-04 ප්‍රධාන මාර්ගයේ පැල්මඩුල්ල සිට රත්නපුරය නව නගරය දක්වා කොටසේ උදෑසන 0600 සිට උදෑසන 1000 දක්වා පමණ කාලය තුල** රථවාහන තදබදයක් ඇතිවිය හැකි බැවින් එම කාලය තුල ඉහත මාර්ගයේ ගමන් ගන්නා රියදුරන්ට හා මහජනතාවට සිදුවන අපහසුතාවය අවම කර ගැනීම සඳහා මේ සම්බන්ධව ඔබ මාධ්‍ය මගින් ප්‍රචාරයක් ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටී.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**